**ශීර්ෂය 267 - මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ඔක්තෝබර් 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඔට්ටුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකරනු ලැබූ එකතුව රු. මිලියන 1.47 ක් වටිනා ගනුදෙනු 15 ක් සඳහා ඇස්තමේන්තු, අවශ්‍යතා ලැයිස්තුව, දෛනික පැමිණීමේ ඡායා පිටපත්, ගෙවීම් වවුචර් සහ සම්බන්ධිත ලිපිගොනුව ආදිය ඉදිරිපත් නොකිරීමෙන් විගණනයේදී සතුටුදායක ලෙස කළ සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව ගනුදෙනු තහවුරු කිරීමට අවශ්‍ය තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**1.6.2 තැන්පතු ගෙවීම් සහ ශේෂ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 සමාලෝචිත වර්ෂය සඳහා පොදු තැන්පතු ගිණුම්වල එකතුව රු.මිලියන 9.45 ක් වී තිබුණි. අදාළ අරමුණු සඳහා වූ තැන්පතු 66 ක්, රඳවා ගැනීමේ තැන්පතු 113 ක්, ඇප මුදල් තැන්පතු 12 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග නොගෙන පසුගිය මාස 03 සිට වර්ෂ 07 ක් දක්වා රඳවා තිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවය අත්හිටවූ, සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ සේවකයන් 10 | ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| දෙනෙකුගේ හිඟ ණය එකතුව රු.278,621 ක් ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට පසුගිය වර්ෂ 03 සිට වර්ෂ 25 ක් දක්වා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ඇතැම් ලේඛන පවත්වාගෙන නොමැති අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන නොතිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | **ලේඛන වර්ගය** | | |
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | | |
| | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) හි 11 වැනි ඇමුණුම ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2)හි 11 වැනි ඇමුණුම ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් නිවැරදිව හා විධිමත්ව විගණකාධිපතිවරයාගේ එකඟත්වය සහිතව පවත්වාගෙන යා යුතුය. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතුය. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (iii) | පාඩු පිළිබඳ ලේඛනය | | |
| | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන අනුවත්, එහි | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | පවත්වාගෙන නොතිබුණි. | සඳහන් වූ ආකාරයටත්, පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා ගත යුතුය. | කර ඇත. |
| (iv) | බැරකම් පිළිබඳ ලේඛනය | | |
| | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් දෛනිකව පරිශීලනය කළ හැකි ආකාරයෙන් බැරකම් සම්බන්ධයෙන් වන ලේඛනයේ බැරකම් ලේඛනගත කළ යුතුය. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (v) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | | |
| | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් ආකාරයට රජයේ ගොඩනැගිලිවල පවතින සියළුම විදුලි උපකරණ සඳහා භාණ්ඩ ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (vi) | රාජකාරී දුරකථන ලේඛනය | | |
| | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාරව දුරකථන ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාරව දුරකථන ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (vii) | ඇපකරුවන් පිළිබඳ ලේඛනය | | |
| | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් සහ සේවකයින්ගේ තොරතුරු ඇතුළත් ඇපකරුවන්ගේ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව සඳහන් කළ විස්තර ඇතුළත් වන ආකාරයෙන් ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (viii) | ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛන | | |
| | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | පවත්වාගෙන යා යුතුය. | |

(ix) ලංසු කැඳවීමේ ලේඛනය

------------------------------

| | | |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් ලංසු කැඳවීමේ ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් ලංසු කැඳවීමේ ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) පුනරාවර්තන වියදම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනකට පුනරාවර්තන වියදම් සඳහා වැය විෂයයන් 12 ක් යටතේ සලසා තිබූ ප්‍රතිපාදනවලින් සියයට 06 සිට සියයට 88 ක් දක්වා පරාසයකින් ඉතිරිවීම් එකතුව රු.මිලියන 108.92 පැවති බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රතිපාදන ඵලදායී ආකාරයෙන් උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| **(ආ) මූලධන වියදම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනකට මූලධන වියදම් සඳහා වැය විෂයයන් 08 ක් යටතේ සලසා තිබූ ප්‍රතිපාදනවලින් සියයට 08 සිට සියයට 100 ක් දක්වා වූ පරාසයකින් ඉතිරිවීම් එකතුව රු.මිලියන 58.38 පැවති බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රතිපාදන ඵලදායී ආකාරයෙන් උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු තහවුරු කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ | 2018 අංක 19 දරන ජාතික | ක්‍රියාමාර්ග |

| | | |
|---|---|---|
| 38 වගන්තියේ විධිවිධානවලට අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් තහවුරු කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br><br>මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.<br><br>මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය පහසු කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කොට ක්‍රියාත්මක කරගෙන යව බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී විසින් තහවුරු කළ යුතු වුවත්, එම පද්ධතියේ ඵලදායීතාවය සම්බන්ධයෙන් කාලයෙන් කාලයට සමාලෝචනයන් සිදු කොට ඒ අනුව පද්ධතියක් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වෙනස්කම් සිදුකළ යුතුය. එසේ වුවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කොට එහි පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි සමාලෝචනයක් සිදුකොට ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණන පනතේ 38 වගන්තියේ විධිවිධානවලට අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී විසින් කටයුතු කළ යුතුය. | අනාගතයේදී ගනු ලැබේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු.මිලියන | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| මුදල් රෙගුලාසි 396 | 1.45 | පසුගිය මාස 01 සිට 06 ක් දක්වා ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් | චෙක්පත් ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | මේ දක්වා සුදුසු ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | | |
| (ආ) | 1988 අගෝස්තු 30 දිනැති අංක 29/88 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 3.38 | ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් එකඟතාවය ලබා නොගෙන සේවකයන් 58 දෙනෙකුට ලබා දී තිබූ වර්ෂ දෙකේ ණය අඛණ්ඩව එලෙසම හිඟහිටිව පැවතුණි. | ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් එකඟතාවය ලබාගැනීමට කටයුතු කර තිබිය යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | | |
| | (i) 3.9.1 මාර්ගෝපදේශය | 10.34 | ගොවිජන සංවිධාන 02 ක් සහ ග්‍රාම සංවර්ධන සමිති 03 ක් සඳහා රු.මිලියන 2 කට අධික වූ මාර්ග 05 ක් ප්‍රතිසංස්කරණ කාර්යයන් කොන්ත්‍රාත් 10 කට බෙදා මාසයක් බැගින් වූ කාල අවකාශයකින් පසුව වන පරිදි ලබා දී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| | (ii) 2.11.3 මාර්ගෝපදේශය | - | සමාලෝචිත වර්ෂයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අනුමත නියැදිවලට අනුකූල නොවූ ආකාරයෙන් ලංසු විවෘත කිරීමේ සාරාංශ සටහන, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාරාංශ සටහන සහ ප්‍රසම්පාදන කමිටු සටහන් සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 මාර්ගෝපදේශය ප්‍රකාරව සුදුසු පියවර ගත යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**2.4 අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.58,922 ක් වටිනා ගනුදෙනු 02 ක් සඳහා මුදල් රෙගුලාසි 136 ප්‍රකාරව ගෙවීමට අනුමැතිය ලබා නොගෙන ගෙවීම් සිදුකර තිබුණි. | මුදල් රෙගුලාසි 136 ප්‍රකාරව අනුමත කළ ගනුදෙනු සඳහා පමණක් ගෙවීම් සිදුකළ යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ තුනුක්කායි සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.130,229 ක් වටිනා ගෙවීම් 07 ක් සඳහා මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව තහවුරු කිරීමකින් තොරව සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව ගෙවීම් කිරීමේදී තහවුරු කරගැනීම සඳහා කටයුතු කළ යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වුවත්, මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් මාසිකව සමාලෝචනයට භාජනය නොකළ, නිම නොකරන ලද ව්‍යාපෘති සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනයට භාජනය කර, ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

### 3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ග 12 ක ව්‍යාපෘති මඟින් මූල්‍ය ප්‍රතිපාදන සපයා මාන්තායි නැගෙනහිර, ඔඩ්ඩුසුඩාන්, තුනුක්කායි සහ කරෙයිතුරෙයි පත්තු ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කළ එකතුව රු.මිලියන 183.9 ක් වටිනා මහජනතාව සඳහා නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති 118 ක් පසුගිය වර්ෂ 02 සිට වර්ෂ 06 ක් දක්වා නිෂ්කාර්යව පැවතුණි. | නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති නැවත සමාලෝචනයකට භාජනය කර ඵලදායී ආකාරයෙන් උපයෝජනය කළ බවට, සහතික කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙන් ලැබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 24.19 ක මුළු පිරිවැයකින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුලතිව් සෙල්වපුරම්හි අනාරක්ෂිත හා අපයෝජනයට ලක් වූ දරුවන් සඳහා මධ්‍යස්ථානයක් ඉදිකොට 2014 දෙසැම්බර් 26 දින දිස්ත්‍රික් ලේකම්වරයාට තොග අයිතමයන් 481 ක් සහ සවිකිරීම් සමඟ භාර දී තිබුණි. කෙසේ වුවද, පසුගිය වර්ෂ 04 කට අධික කාලයක සිට මෙම මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොතිබූ අතර ශක්‍යතා වාර්තා, අනාරක්ෂිත හා අපයෝජනයට ලක් වූ දරුවන්ගේ තොරතුරු හා මධ්‍යස්ථානය ඵලදායීව උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රයෝජනවත් ආකාරයෙන් උපයෝජනය කිරීම සහතික කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වීම. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

### 3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික සංහිඳියාව සහ සහයෝගීතාවය සඳහා වූ කාර්යාලයේ ව්‍යාපෘති සහ ගම් පෙරළිය වැඩසටහන් ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයේදී සිදු කළ යුතුව තිබූ එකතුව රු.මිලියන 9.73ක මාර්ග 16 ක් ප්‍රතිසංස්කරණය කිරීම සහ | මුදල් රෙගුලාසි 139 ප්‍රකාරව නිම කළ කාර්යයන් සඳහා පමණක් ගෙවීම් සිදුකළ යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | අනෙකුත් මූලධන කාර්යයන් නිම නොවී තිබූ බව නිරීක්ෂණය විය. එසේ වුවද, ඒ සඳහා වූ චෙක්පත් ගෙවීම සඳහා සූදානම් කර තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන විශේෂිත වැඩසටහන (RIDSP), නැවත පදිංචි කිරීම සඳහා වූ විශේෂ බලකාය (TFR) සහ ආර්ථික ශක්තිමත් කිරීමේ සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ එකඟතා ව්‍යාපෘතිය (REEP) වැනි ව්‍යාපෘති මඟින් ප්‍රතිපාදන සලසා තිබූ කර්මාන්ත 13 ක් මේ දක්වා අවසන් නොකර එකතුව රු.මිලියන 8.6 ක් වටිනා කාර්යයන් සම්පූර්ණයෙන් ඉටු කළ බවට සහතික කරනු ලැබූ තක්සේරු වාර්තා, ගෙවීම් වවුචර්, වැඩ අවසන් කළ බවට වාර්තා සහ භාර දී තිබූ ලිපි පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සකස් කර චෙක්පත් ද ලියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා තිබුණි. | මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව සහතික නොකළ ගනුදෙනු සඳහා චෙක්පත් ලියා තිබීම සම්බන්ධයෙන් දැඩි අභ්‍යන්තර පාලන පද්ධතියක් වැඩි දියුණු කළයුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

## 3.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම කාරෙයිතුරෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර තිබූ නමුත් එහි ඇතුළත් නොවූ එකතුව රු.642,460 ක් වූ ලී බඩු සහ සවිකිරීම් මිලදී ගෙන තිබුණි. කෙසේ නමුත්, මෙම ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචනයට ලක් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඵලදායිතාවයක් යුක්ත එකක් බවට පත්කිරීමට සුදුදු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කළ විෂයයන් සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන කාලසටහනට අනුකූලව භාණ්ඩ හා සේවාවන් මිලදී ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබා දී තිබූ විදුලි ජනක යන්ත්‍රය මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පසුගිය වර්ෂ 03 කට වැඩි කාලයක සිට උපයෝජනය නොකර පැවති නමුත් රු.මිලියන 9.80 කට වෙනත් අලුත් විදුලි ජනක යන්ත්‍රයක් (502 කිලෝවොට්ස්) 2016 දෙසැම්බර් මාසයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, මෙම විදුලිජනක යන්ත්‍ර දෙකෙහි පරමාර්ථ, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදුන් විදුලි ජනක යන්ත්‍රයේ පිරිවැය සහ මෙම යන්ත්‍රවල ධාරිතාවය, ක්‍රියාකරවන්නන් තොරතුරු ආදිය විගණනය සඳහා ලැබී නොතිබුණි. එසේ වුවත්, ඉහත නව විදුලි ජනක යන්ත්‍රය, අවශ්‍ය නඩත්තු කිරීම් කිසිවක් සිදු නොකර හා භාවිතයකින් තොරව ගබඩාවේ තබා තිබුණි. | විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීමේ පරමාර්ථය සඳහා උපයෝජනය කළ හැකි අයුරින් ඵලදායීව භාවිතා කිරීමේ ක්‍රමවේදයක් සකස් කර භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉදිරි අනාගතයේදී ක්‍රියා කරනු ලැබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් සිදුකළ යුතුව තිබූ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුණි. | මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව සුදුසු පියවර ගත යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**4. තිරසාර සංවර්ධනය**

**4.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සෑම රාජ්‍ය ආයතනයක්ම තිරසාර සංවර්ධන ඉලක්කයන්, එක්සත් ජාතීන්ගේ වැඩසටහන න්‍යාය පත්‍ර | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

230 ට එකඟවත්, 2017 ඔක්තෝබර් 03 දිනැති 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත අනුගමනය කරමින් ක්‍රියාකළ යුතු අතර චක්‍රලේඛ මඟින් ඉහත කරුණු සම්බන්ධයෙන් සියළුම රාජ්‍ය ආයතන දැනුවත් වී තිබුණි. එයට අනුකූලව සියළුම රාජ්‍ය ආයතන විසින් අදාළ ආයතනයේ අධිකාරී බල සීමාවන් යටතේ වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්, කුමන ආකාරයෙන් කටයුතු කළ යුතුද යන්න දැනුවත් වී තිබිය යුතු වුවත් මෙහි ක්‍රියාකාරීන් පිළිබඳ අරමුණු, ඉලක්ක සහ මෙම ඉලක්ක ළඟා කරගැනීම මැනීමට අවශ්‍ය මෙවලම් හඳුනාගෙන නොතිබුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**

---

**5.1 අනුමත සේවක සංඛ්‍යාව, තථ්‍ය සේවක සංඛ්‍යාව**

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ පරිදි මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාළ වර්ග 04 ක සේවක සංඛ්‍යාව අදාළ අනුමත කළ සේවක සංඛ්‍යාව සහ සමාලෝචිත වර්ෂයේ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර නිසි අයුරින් නොලැබීම නිසා සේවක වැටුප් සහ වැඩ බෙදීම් ආදිය සතුටුදායක ලෙස පිළිගෙන විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | අනාගතයේදී ක්‍රියාකරනු ලැබේ. |